# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

## මිල ගණන් කැඳවීම.

**ලුනාව "Sea View Residencies" නිවාස ව්‍යාපෘතියෙහි ගොඩනැගිලි අංක 01, 02 හී (Block-01,02) බිම් මහල, වාණිජ්‍ය ඉඩකඩ දීර්ඝකාලීන බදු කුලී පදනම මත බැහැර කිරීම.**

මොරටුව නගරයෙහි අංක 95, චාල්ස් පෙදෙස, ලුනාව ලිපිනයෙහි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරන ලද "Sea View Residencies" නිවාස ව්‍යාපෘතියෙහි ගොඩනැගිලි අංක 01, 02 හී බිම්මහල ව්‍යාපාරික ඉඩකඩ මාසික බදු කුලී පදනම යටතේ (අවමය අවු. 10ක කාලයක් සඳහා) ලබාදීම සඳහා සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) විසින් මිල ගණන් කැඳවනු ලැබේ. අදාල විස්තරය පහත පරිදි වේ.

| ගොඩනැගිලි අංකය | බිම්මහල | ප්‍රමාණය ($m^2$) | $m^2$ සඳහා වාර්ෂික කුලී වටිනාකම | බදු කුලී සුරක්ෂණය | ජල හා විදුලි ගාස්තු සුරක්ෂණය | දින 105ක කාලයක් සඳහා වලංගු වන පරිදි ඉදිරිපත් කළ යුතු ලංසු සුරක්ෂණය |
|---|---|---|---|---|---|---|
| Block 01 | වාණිජ ප්‍රදේශ 01 | 260 $m^2$ | රු. 5,288.46 | මාස 06ක බදු කුලී වටිනාකම | රු. 55,500.00 | රු.66,575.00 |
| | වාණිජ ප්‍රදේශ 02 | 94 $m^2$ | රු. 5,319.15 | | රු. 20,100.00 | රු.24,100.00 |
| | වාණිජ ප්‍රදේශ 03 | 275 $m^2$ | රු. 5,272.73 | | රු. 59,000.00 | රු.70.500.00 |
| Block 02 | වාණිජ ප්‍රදේශ 01 | 74 $m^2$ | රු. 4,662.16 | | රු. 15,500.00 | රු.19,000.00 |

**සටහන**

01. ටෙන්ඩර් පිරිනමනුයේ රජයේ තක්සේරු වටිනාකමට සාපේක්ෂව ඉහළම මාසික බදු කුලී වටිනාකම ඉදිරිපත් කර ඇති ටෙන්ඩර්කරු වෙත ය.
02. සුදුසුකම් ලබන ටෙන්ඩර්කරුවන් විසින් ඉහත වගුවෙන් දක්වා ඇති පරිදි බදු කුලී සුරක්ෂණය හා ජල, විදුලි බිල්පත් සුරක්ෂණය ලබාදිය යුතු අතර බදු ගිවිසුම් කාල සීමාව අවසානයේ එම මුදල අධිකාරිය විසින් නැවත ගෙවනු ලැබේ.
03. බදු කුලීකරුවන් විසින් එකී ව්‍යාපාරික ඉඩකඩ හෝ එහි යම් කොටසක භුක්තිය වෙනත් අයෙකුට විකිණීම, පැවරීම, උකස් කිරීම හෝ අතුරු බද්දට දීම හෝ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව නොකල යුතුය. එසේ අන් අයෙකු භුක්තියේ සිටින බවට කරුණු තහවුරු වුවහොත් බදු ගිවිසුම අවලංගු කිරීමේ බලය පළමු පාර්ශවය වන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සතු බව දෙවන පාර්ශවය පිලිගත යුතුය.

04. දෙවන පාර්ශවය විසින් ලබා ගනු ලබන වගකීම් සඳහා පළමු පාර්ශවය විසින් වගනොකියන අතර ජලය හා විදුලි සම්බන්ධතාවයට අදාල කටයුතු මෙන්ම අවශ්‍ය යටිතල පහසුකම් තමා විසින් සපුරා ගැනීම දෙවන පාර්ශවයේ වගකීමක් වේ.

05. ටෙන්ඩර් ලේඛන ගාස්තු ලෙස ආපසු නොගෙවන ලබන රු. 3,500.00ක මුදලක්(එක් ටෙන්ඩරයක් සඳහා) 09 වන මහල, සෙත්සිරිපාය කාර්යාල පරිශ්‍රයෙහි පිහිටි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සරප් වෙත 2024.01.08 සිට 2024.01.26 දක්වා රජයේ වැඩකරන දිනයන් හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුළ ගෙවා ටෙන්ඩර් පත්‍රිකා(සිංහල භාෂාවෙන් පිළියෙල කරන ලද) නියෝජ්‍ය අධ්‍යක්ෂ(ප්‍රසම්පාදන සහ අලෙවිකරණ) වෙතින් ලබා ගත හැකි අතර එක් ටෙන්ඩර් පත්‍රිකාවක් මඟින් මිල ගණන් ඉදිරිපත් කළ හැක්කේ එක් වාණිජ ප්‍රදේශයක් සඳහා පමණක් වන අතර මිල ගණන් ඉදිරිපත් කල හැක්කේ අධිකාරිය විසින් නිකුත් කරන ලද ටෙන්ඩර් පත්‍රිකාව මඟින් පමණි.

06. ව්‍යාපෘති භූමිය හා ගොඩනැගිලි සැකැස්ම භෞතිකව පරීක්ෂා කිරීම 2024.01.22 සිට 2024.01.26 දක්වා රජයේ වැඩකරන දිනයන් හි පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා කාලය තුළ සිදුකළ හැක.

07. ලංසු සුරක්ෂණ වල වටිනාකම හා වලංගු කාලය ඉහත වගුවේ දක්වා ඇති පරිදි වන අතර එම ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් අනුමත ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක රජයේ පිළිගත් බැංකුවකින් ලබාගත් ආපසු ගෙවනු ලබන ඇප බැඳුම්කරයක් මඟින් හෝ අනුමත රක්ෂණ ආයතනයකින් ගෙවා ලබාගනු ලබන ලදුපතෙහි පිටපතක් සමඟ සෑම ටෙන්ඩරයක්ම ඉදිරිපත් කල යුතු අතර ටෙන්ඩර් ඇප තැන්පත් ලදුපතෙහි පිටපතක් නොමැතිව ඉදිරිපත් කරනු ලබන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. ටෙන්ඩර්පත් භාර ගැනීම 2024.01.29 දින පෙ.ව 10.00ට අවසන් වේ. මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා නියමිත වේලාවට පෙර **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, 09 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් හෝ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"ලුනාව නිවාස සංකීර්ණයේ ව්‍යාපාරික ඉඩකඩ බදු කුලීපදනම මත ලබා ගැනීම-(ගොඩනැගිලි අංකය......, වාණිජ ප්‍රදේශය.......)"** ලෙස සඳහන් කල යුතුය. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ වහාම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සභාපති කාර්යාලයේ දී ටෙන්ඩර්පත් විවෘත කරන අතර එම අවස්ථාව සඳහා අවශ්‍ය නම් ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගී විය හැක.

09. ටෙන්ඩර් පිළිබඳ වැඩිමනත් තොරතුරු නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂක(ප්‍රසම්පාදන සහ අලෙවිකරණ)- 0112884147/ 0770101997 වෙතින් ලබාගත හැක

10. ලැබුණු ලංසු වලින් සුදුසු ලංසුවක් පිළිගැනීමට හෝ සියලු ලංසු ප්‍රතික්ෂේප කිරීමට සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව(ප්‍රධාන) හට අයිතියක් ඇති අතර, එම කමිටුවේ තීරණය අවසාන තීරණය වේ. ලංසුපත් පිළියෙල කිරීම සම්බන්ධව කිසිඳු පිරිවැයක් සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වගකීමක් නොදරයි.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය,
09 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.